**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 13**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.2.3.දෙගල්දොරුව රජ මහා විහාරය |

**ඉගෙනුම් අත්වැල**

**දෙගල්දොරුව රජමහා විහාරය**



- දෙගල්දොරුව රජ මහා විහාරය ලෙන් විහාර වර්ගයට අයත් වේ.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් මෙම විහාරය ගොඩනංවා ඇත.
- මහනුවර යුගයේ සිතුවම් හමුවන වැදගත් ස්ථානයකි.
- දෙවරගම්පල සිල්වත් තැන මෙහි සිතුවම් ඇද ඇත. කොස්වත්තේ සිත්තර නයිදේ හා නීලගම පටබැන්දා මොහුට සහය වී ඇති බවට පොත්පත් වල සඳහන් වේ.
- ගර්භ ගෘහයට ඇතුළු වන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර වෙස්සන්තර ජාතකය හා සුතසෝම ජාතකය වැදගත් වේ.
- වෙස්සන්තර ජාතක කතාව තුළ ගැබ්ව ඇති ඇලි ඇතු දන්දීම දැක්වෙන චිත්‍රය විශිෂ්ට නිර්මාණයක් වශයෙන් සැලකේ, ඇතුන්ගේ සජීවී චලනය හා රිද්මය නිරූපණය ඊට හේතුව වේ.



- සිතුවම් නිර්මාණ ආශ්‍රිතව දැකගත හැකි ප්‍රධාන ලක්ෂණ.
  - තීරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය හා පාර්ශව දර්ශී රූප.
  - ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය හා පසුබිම සඳහා අඳුරු රතු වර්ණ භාවිතය.
  - වර්ණ සඳහා කහ ,කොළ, රතු ,කළු, සුදු ආදී වර්ණ භාවිතය.
  - ප්‍රෙස්කෝ සිකෝ (වියළි බදාමය මත සිතුවම් ඇදීම)ක්‍රමයට සිතුවම් නිර්මාණය කිරීම.
  - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛා කරණය.
  - පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය.
  - සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාලෝක රීතීන් නො සැලකීම.
- විහාර වියන් තලයේ විශාල චිත්‍ර සංරචනයක් ලෙස මාර පරාජය සිතුවම නිරූපණය කර ඇත.
- මෙය සුවිශේෂී සමාජ ප්‍රකාශනයක් සහිත නිර්මාණයක් වශයෙන් සැලකේ.
- මාර පරාජය සිතුවමින් තුවක්කුවක් අතින් ගත් මාරයකු දක්වා තිබීමෙන් මෙම සිතුවම තුළ සමකාලීන අත්දැකීම් හා ද්‍රව්‍ය නිරූපණය කිරීමට ශිල්පියා ගත් උත්සාහය හඳුනාගත හැකිය.
- සිතුවම් වලට අමතරව පිහිටි ගලෙහි නෙලා ඇති සඳකඩ පහණ මහනුවර යුගයේ විශේෂ නිර්මාණයක් වන අතර එහි ප්‍රධාන මෝස්තරය ලෙස තිරිගිතලය යොදා ඇත.

**ක්‍රියාකාරකම**

1. දෙගල්දොරුව විහාරය අයත් වන්නේ කුමන විහාර වර්ගයටද ?
2. දෙගල්දොරුව විහාරය ඉදිකරවන ලද්දේ කුමන රජතුමා විසින්ද ?
3. දෙගල්දොරුව විහාරයේ සිතුවම් නිර්මාණය කරන ලද ශිල්පියා සහ සහයකයන් කවුද?
4. මෙම විහාරස්ථානයේ දක්නට ලැබෙන ජාතක කතා දෙකක් ලියන්න?
5. දෙගල්දොරුව විහාරයේ සිතුවම් අතර දක්නට ලබෙන ප්‍රධාන ලක්ෂණ මොනවාද ?

| |
|---|
| පැවරුම - දෙගල්දොරුව රජමහා විහාරයේ සිතුවම් පිළිබඳ තොරතුරු එකතු කරන්න. |